## 8.2 දර්ශනපති උපාධි පාඨමාලාව

| | | |
|---|---|---|
| 8.2.1 | මූලික සුදුසුකම් | • පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයට ප්‍රථම පන්ති සාමර්ථ්‍යයක්/ දෙවන පෙළ (ඉහළ) පන්ති සාමර්ථ්‍යයක් ලබා තිබීම<br>**හෝ**<br>• පිළිගත් විශ්වවිද්‍යාලයකින් ශාස්ත්‍රපති (එක් අවුරුදු) උපාධියක් ලබා තිබීම<br>**හෝ**<br>• ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ සුදුසුකමක් සපුරා තිබීම |
| | පර්යේෂණ කාර්ය පටිපාටිය | විශ්වවිද්‍යාලය මගින් ලියාපදිංචිය තහවුරු කළ පසු නියමිත උපදේශකවරයාගේ/වරුන්ගේ මග පෙන්වීම යටතේ ලියාපදිංචි දිනයේ සිට මාස 03 ක් ඇතුළත පර්යේෂණ මාතෘකාව අනුමත කරගැනීම සඳහා විෂය ප්‍රවීණයකු සහිත අදාළ උසස් උපාධි අධ්‍යයන මණ්ඩලය ඉදිරියේ විනාඩි 20 ක ඉදිරිපත් කිරීමක් (Presentation) කළ යුතුය.<br><br>පළමු සම්මන්ත්‍රණයෙන් මාස 06 ක් ඇතුළත පර්යේෂණයේ සාහිත්‍ය විමර්ශන සම්මන්ත්‍රණය ඉදිරිපත් කළ යුතුය.<br><br>එම සම්මන්ත්‍රණවලට සතියකට පෙර අදාළ සම්මන්ත්‍රණ පත්‍රිකාවේ පිටපත් 12 ක් පශ්චාත් උපාධි අධ්‍යයන ඒකකයට භාර දිය යුතුය. |
| | පර්යේෂණ නිබන්ධයේ ප්‍රමාණය | පර්යේෂණ නිබන්ධය වචන 70,000 කට නොඅඩු සංඛ්‍යාවකින් යුක්ත විය යුතුය. |
| | පර්යේෂණ නිබන්ධය ඉදිරිපත් කිරීම | විශ්වවිද්‍යාලය මගින් නියමකොට ඇති උපදෙස්වලට අනුකූලව සකසා අවසන් කරන ලද නිබන්ධය පිටපත් තුනකින් (03) පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලයට භාර දිය යුතුය. |
| | නිබන්ධ පරීක්ෂකවරුන් පත් කිරීම | විශ්වවිද්‍යාලයීය උසස් උපාධි අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශය අනුව සනාතන සභාව විසින් පරීක්ෂකවරුන් පත් කරනු ලැබේ. |
| | වාචික පරීක්ෂණය | පර්යේෂණ නිබන්ධයේ පරීක්ෂක වාර්තා ලැබීමෙන් අනතුරුව වාචික පරීක්ෂණය පවත්වනු ලැබේ. එහිදී අපේක්ෂකයා විසින් ස්වකීය පර්යේෂණය පිළිබඳ සමස්ත විග්‍රහයක් විනාඩි 20 ක් තුළ ඉදිරිපත් කළ යුතුය. |
| | ප්‍රතිඵල නිකුත් කිරීම | වාචික පරීක්ෂණය සමත්වීමෙන් පසු අදාළ පීඨයේ පීඨාධිපතිගේ නිර්දේශය අනුව සනාතන සභාවේ අනුමැතියෙන් පසු ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ. |
| | උපාධිය වලංගු දිනය | පර්යේෂණ නිබන්ධය පශ්චාත් උපාධි අධ්‍යයන ඒකකයට භාරදුන් දිනය උපාධියේ වලංගු දිනය වේ. එහෙත් වාචික පරීක්ෂණයේ දී අදාළ සංශෝධන සිදු කිරීමට නිර්දේශිත කාලය ඉක්මවා නිබන්ධය භාර දුනහොත්, එම සංශෝධිත පිටපත භාර දුන් දිනය උපාධියේ වලංගු දිනය වේ. |
| | උපාධි සහතිකය නිකුත් කිරීම | ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව අපේක්ෂකයාට උපාධි සහතිකය සඳහා අයදුම් කළ හැකිය. ඒ සඳහා අදාළ ගාස්තු ගෙවිය යුතු වේ. |